# ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
# කොළඹ
***

## ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් නිකුත් කරන ලද ප්‍රකාශය

මහ කොමසාරිස් කාර්යාලය, ඉන්දියානු කොන්සියුලර් ජෙනරාල් කාර්යාලය හෝ සහකාර මහ කොමසාරිස් කාර්යාලය විසින් වීසා නිකුත් කිරීම අත්හිටුවා ඇති බවට වන ප්‍රචාර මහ කොමසාරිස් කාර්යාලය තරයේ ප්‍රතික්ෂේප කරයි.

2. පසුගිය දින කිහිපය තුළ බහුතරයක් ශ්‍රී ලාංකිකයන් වන අපගේ වීසා නිලධාරින් හට සේවයට වාර්තා කිරීමට නොහැකි වීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු සිදු කිරීමේ දුෂ්කරතා පැවතිණ. හැකි ඉක්මනින් සේවා කටයුතු යථා තත්ත්වයට පත් කිරීමට අපි අපේක්ෂා කරමු.

3. ශ්‍රී ලාංකිකයන් හට ඉන්දියාවට පහසුවෙන් සංචාරය කිරීමේ අවස්ථාව ලබාදීමට අපි කැපවී සිටිමු. ඉන්දියානුවන් ශ්‍රී ලංකාවට සාදරයෙන් පිළිගන්නා අයුරින්ම ශ්‍රී ලාංකිකයන් ඉන්දියාවට සාදරයෙන් පිළිගැනේ.

***

කොළඹ
2022 මැයි 13